| | | |
|---|---|---|
| මොණරාගල - ප්‍රධාන දේශක, පාඨමාලාවාරිය, උත්තරපත්‍ර පරීක්ෂක. **H.M.A බණ්ඩාර** Sinhala(Hons)Dip in Education | **11 ශ්‍රේණිය** **පළමු වාර විභාගය ඉලක්ක ප්‍රශ්න පත්‍රය** | වැඩිම ලකුණු වැඩිම A සාමර්ථ්‍ය |
| **ප්‍රශ්නපත්‍ර පංතිය** | **සිංහල භාෂාව හා සාහිත්‍ය** | කාලය: පැය 02 |
| | මහනුවර සොඳම සිංහල ගුරුවරයා මොණරාගල සිංහල සම්මන්ත්‍රණය | ලකුණු: |

❖ **ශ - ඊ තෙක් ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

01. "උපායනම් තමා කිම්ද ? මේ සා මහත් වූ තොපගේ උපායකින් වැඩකුත් නිමාවකුත් දුටු දැ නැති"
    (අ) මෙසේ කීවේ කාහටද ?
    (ආ) මෙසේ කීමට හේතුව කුමක්ද ?

02 පන්සිළු වීණා නද පසු          බැස් වූ
   මන් පිනවන වෙණ නදයෙන්          තොස් වූ
   ..................................................
   ..................................................

    (අ) මෙහි ඉතිරි කවි පේළිය සම්පූර්ණ කරන්න
    (ආ) "පන්සිළු" යන්නෙහි අර්ථය ලියන්න

03. "වහන්ස හේ මට මුසා වෙයි. මා විසින් බොහෝ සත්නු දැන මරණ ලදහ."
    (අ) "හේ, මට යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද ?
    (ආ) මෙම පාඨය අයත් මුල් කෘතිය හඳුන්වන්නේ කිනම් නමකින්ද ?

04. "මබ දෙදෙන මා සමග
    නො ආවොත් යන්ට වේ
    (අ) මෙසේ ප්‍රකාශ කළේ කවරෙක්ද ?
    (ආ) සරත්චන්ද්‍ර මහතා ලියූ ස්වයං ලිඛිත චරිතාපදානය හඳුන්වන්නේ කිනම් නමකින්ද ?

05. "එසේය, අනික් කාට කියම්ද ? තොපම තොට ඇවිදිනා කටයුතු හෙයින් තොපම අරබයා කියමි."
    (අ) මෙසේ ප්‍රකාශ කළේ කවරෙක්ද ?
    (ආ) මෙම ඡේදය අයත් ග්‍රන්ථය ලිවීමට මූලාශ්‍රය වූ පාලි ග්‍රන්ථය කුමක්ද ?

06. (අ) "ගංගාවේ සංගීතය" කවි පංතිය රචනා කළ රචකයා රචනා කළ කවි සඟරාවක් නම් කරන්න
    (ආ) එකුමා අයත් කවි යුගය නම් කරන්න

07. කාටත් හිමි පොදු දේ          නම්
    නැති බැරි හිඟ අවහිර          නම්
    මේ දේ මැඩ ගෙන          දක්තම්
    පැව තමයි සුරු          විරුකම්

    (අ) මෙහි දැක්වෙන පරිදි සුර විරකමේ ලක්ෂණ මොනවාද ?
    (ආ) මෙය කාගේ කවි සංකල්පනාවක්ද ?

08. "මුලින්ම වැට අද්දර කුඩා ගස් හා පඳුරු සතව වැඩී වැට යට කර ගත්තේය.
    (අ) මෙම ඡේදයෙන් විස්තර කරන්නේ කුමක් ගැනද ?
    (ආ) ඡේදය උපුටාගත් ග්‍රන්ථය රචනා කළේ කවරෙක්ද ?

09. (අ) අතීතයේ පටන් ජනකවි පැවතුන බවට ඇති මූලාශ්‍රය ලියන්න
    (ආ) ජනකවියෙහි ලක්ෂණ දෙකක් ලියන්න

10.

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. "නගන ලද දළ පුළු සේසත් ඇති එක් සියයක් රාජසනායි වූ පිළිවෙල කොට තබන ලද ශ්‍රී **චතුරිනී** දැක මහ බෝසතානන් වහන්සේ විසින් වදාරණ ලද ක්‍රමයෙන් ම සියල්ල කොට සේනා මධ්‍යයට වැද බොහෝ දෙනා **ක්ෂෝභ කොට** තමන්ගේ මිදුලු නුවරට පලා ගියහ."
   - (අ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න
   - (ආ) අංකිත පදවලට අර්ථය සපයන්න.

2. "යම් කවර දිසා භාගයකින් දමා වූ **දඬු පහණ හකුරු** අවුත් මහ තෙරුන් මැ වෙයි. හෙයි ඔහු මහා සම් බිඳි ඇට දක්වා **බුත් හිසින්** ලේ වගුරුවමින් බුත් පා ඇඹිවු, හිණැහිරුණු සිවුරු ඇඹිවු,"
   - (අ) ඉහත ඡේදයෙන් නිරූපනය වන තැනැත්තාට සිදු වී ඇත්තේ කුමක්දැයි කෙටියෙන් ලියන්න
   - (ආ) අංකිත පදවල අර්ථය වෙන වෙනම ලියන්න.

3. "උග්ගසේනයෝත් තමන් පාතා කෙළි තමන්ම දක්නා පමණ බුත් රැස් වූවන් නොලබන නියාව දැන **මුසුප්පුව** ගොසින් හවුරුද්දකින් සමසකින් අරුමයක් සේ පාතා **කෙළි** බුදුන් අවුත් මේ තැනට සම්භව ඔබම අනුකම් පහළ වූ වා සේ"
   - (අ) අංකිත පදවල අර්ථය ලියන්න
   - (ආ) මුළු ඡේදයේම අර්ථය ලියන්න

4. අසන පිසින් නයි කැල **ඔසළෝයා**
   ඔවුන වෙනම සිටිනා ගුරුළෝයා
   වයන ඒ වෙණ නද **ලොබ ම** **සළෝයා**
   ඊදින මිට සිත සිහි නො කළෝයා

   - (අ) අංකිත පදවල අර්ථය ලියන්න
   - (ආ) මුළු කවියේම අර්ථය ලියන්න

5. "සිනිඳු වස්ත්‍ර මිණි අබරණ
   **තුඹුල** මාලිගා
   සුවඳ බොජුන් සැප සයනා
   **මිරිවැඩි** සඟලා හැරදා මම
   ආවෙමි වලටා"

   - (අ) අංකිත පදවල අර්ථය ලියන්න
   - (ආ) ඡේදයේ දැක්වෙන අවස්ථාව ලියන්න

03. සද්ධර්ම රත්නාවලී කතුවරයා චරිත නිරූපනයේදී හාස්‍ය උපහාසය මෙන්ම අනුකම්පාවද, පුද්ගල මනෝභාවයන්ද මැනවින් නිරූපනය කර ඇත. එක් කොටසකට නිදසුන් දෙක බැගින් ගෙන මෙය විමසන්න.

04. අම්බාවතුරේ දමන කතා වඩාත් රසවත් වී ඇත්තේ
1. භාෂා භාවිතය
2. චරිත නිරූපනය

යන කරුණු නිසාවෙන්ය. එක් කොටසකට නිදසුන් දෙක බැගින් ගෙන මෙය විමසන්න.

05. ගුත්තිලගේ වීණා නාදයේ මිහිරියාව නිසා එය අසා සිටි මිනිසුන් මෙන්ම සතුන්ටද තමා අමතක වී හැසිරුණ බව සිත්ගන්නා අයුරෙන් නිරූපනය කර ඇත. නිදසුන් හතරක් මගින් මෙය විමසන්න.

06. සිංහබාහු නාට්‍යයෙහි සුප්පා දේවියගේ චරිත නිරූපනය වන්නේ දරුක සෙනෙහස මෙන්ම ස්වාමිපති භක්තියෙන් යුත් චරිතයක් ලෙසින්ය. නිදසුන් තුනක් දෙමින් විමසන්න.

07. යහපත් ජීවිතයක් සඳහා ජන කවියා උසස් උපදෙස් රාශියක් දීමට සමත් වී ඇත. නිදසුන් තුනක් මගින් මෙය විමසන්න.

08. ජාතක කතාකරුවා කේවට්ට චරිතය නිරූපනය කරන්නේ හාස්‍ය හා උපහාසයෙන්ය. නිදසුන් දෙකක් මගින් විමසන්න.

09. බැද්දේගම මිනිසුන් මෙන්ම ගමද ක්‍රමයෙන් අභාවයට යන බව කතුවරයා සංකේත භාවිතා කරමින් කලාත්මකව නිරූපනය කරයි. නිදසුන් තුනක් මගින් විමසන්න.